**සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**(සිංහල භාෂා ඒකකය)**

**සිංහල භාෂාව හා සාහිත්‍ය තරගාවලිය - 2023**

**පාසල් මට්ටම**

1) අපේක්ෂකයාගේ නම :- ....................................................................................................

(මුලකුරු සමඟ නම පැහැදිලිව ලියන්න.)

2) විදුහලේ නම හා ලිපිනය :- ....................................................................................

....................................................................................................................

3) පාසල් වර්ගය :- 200 ට අඩු/ 201-500/ 501 ට වැඩි

4) කලාපය :- ....................................................................................................

5) කොට්ඨාසය :- ....................................................................................................

---

**භාෂා භාවිතය හා අවබෝධය**

**10 ශ්‍රේණිය** **කාලය පැය 02 යි.**

❖ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

**I කොටස**

01) පහත දැක්වෙන පදවල අක්ෂර වින්‍යාසය නිවැරදි කර නැවත ලියන්න.

i. ෛ එශ්වර්යය - ------------------------------------

ii. අභිනිශ්ක්‍රමනය - ------------------------------------

iii. අභ්‍යවකාශය - ------------------------------------

iv. අධිශ්ඨානය - ------------------------------------

v. අභාශය - ------------------------------------

(ලකුණු 5)

02) පහත දැක්වෙන රූඩී/ ඉඟි වැකිවලින් කියවෙන අදහස ඉදිරියෙන් ලියන්න.

i. අනුන්ගෙ පානෙන් එළිය බලනවා - ------------------------------------

ii. අං ඇවිල්ලා - ------------------------------------

iii. අඩන්න ඕනෙලු කිරි එරෙන්න - ------------------------------------

iv. නැග්ග ඉනිමගට පයින් ගහනවා - ------------------------------------

v. කටින් බගල කොළ හිටවනවා - ------------------------------------

(ලකුණු 10)

03) පහත දැක්වෙන පදවලට විරුද්ධාර්ථ පදය බැගින් ලියන්න.

i. ආවරණ - ------------------------------------

ii. උත්තම - ------------------------------------

(ලකුණු 4)

04) පහත දැක්වෙන පදවල ප්‍රකෘති වෙන් කර ලියන්න.

i. මාලුවෝ - ------------------------------------
ii. කැඩුවේය - ------------------------------------
iii. වනිතාව - ------------------------------------

(ලකුණු 6)

05) පහත වාක්‍ය නිදොස් කොට ලියන්න.

i. නව සංවිධායක මණ්ඩලයේ සාමාජිකාවන් ද ඇත.
ii. වනස්පතීහු මනුෂ්‍යානට ආහාර ද සෙවන ද ඔසු ද ලබා දෙයි.
iii. ළමයි කැටුව ගුරුවරු දේශන ශාලාවට පැමිණෙයි.
iv. කම්කරුවෝ වැඩ කරද්දී නිලධාරීහු අධීක්ෂණය කරති.
v. අයියාත් නංගීත් මමත් එදා නාට්‍ය ගැන කතා බවක යෙදුනේ ය.

(ලකුණු 10)

06) පහත ප්‍රදේශීය ව්‍යවහාරයන් සඳහා යෙදෙන පොදු ව්‍යවහාරයන් ලියන්න

i. ඔයනවා - -----------------------------------------
ii. පුහුල් - -----------------------------------------

(ලකුණු 4)

07) පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවා ලියන්න.

i. අතීත රජවරු මහ වැව් සෑදුවෝය.
-----------------------------------------------------------------------------------
ii. උපාසිකාව බණ පොත් පෙරළුවාය.
-----------------------------------------------------------------------------------
iii. වන ඇත්තු වගා පාලු කරති.
-----------------------------------------------------------------------------------

(ලකුණු 6)

08) පහත සඳහන් පද විසන්ධි කර ලියන්න.

i. ඔවුනොවුන් - ------------------------------------
ii. මුනිතුමා - ------------------------------------
iii. පංචේන්ද්‍රිය - ------------------------------------

(ලකුණු 6)

09) පහත සඳහන් ප්‍රත්‍ය යොදා තද්ධිත නාම පද එක බැගින් දක්වන්න.

i. ඉක - ------------------------------------
ii. මුවා - ------------------------------------

(ලකුණු 4)

10) පහත අදහසට ගැළපෙන තනි පද ලියන්න.

i. දුරදිග බලා ක්‍රියා කරන
-----------------------------------------------------------------------------------
ii. බොහෝ දේ අසා දැන උගත්කම් ලැබූ
-----------------------------------------------------------------------------------
iii. විවිධාකාර වර්ණයන්ගෙන් යුක්ත වූ
-----------------------------------------------------------------------------------
iv. අනුන්ට කරන උපකාර
-----------------------------------------------------------------------------------
v. යම් වගාවක පලදාව
-----------------------------------------------------------------------------------

(ලකුණු 10)

11)

i. ණ, ළ, ඹ, ම, ඥ, ඬ, හ, ෂ යන අකුරු අතරින් පහත අක්ෂර වර්ග තෝරා ලියන්න.

අ) නාසික්‍ය අක්ෂර

ආ) අර්ධ නාසික්‍ය අක්ෂර

ii. අ) "කුමරියක්" යන්නෙහි අනුක්ත පදය ලියන්න

ආ) "පැදුරු" යන පදයෙහි පිල්ලම් නම් කරන්න.

iii. "සීතල සුළඟ රළුවට ඇඟ වැදෙනවද" යන කවි පදයෙහි ඇති වචන අකාරාදි පිළිවෙළට ලියා දක්වන්න.

(ලකුණු 5)

**II කොටස**

11) මෙම කවි පන්තිය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ඇති යම් බලය පමණින් තම තමන් හට
යුතුකම් ඉටු කරනු මිස සමයට රටට
පැරදුම් දිනුම් වැනසුම් සැනසුම් වලට
සැලසුම නොකොට එව් කවුරුත් ඉදිරි යට

බලව් පොලොන්නරු අනුරාපුර පෙදෙස
සිතව් පැවති නිදහස එහි පෙර දවස
නගව් තව තවත් කිරසර තරුණ ගොස
වරෙව් යමව් නැගිටිවු නොනිදව් මෙලෙස

ඉපදුණ රටට අදහන ආගමට සෙට
මොන මොන අන්දමින් මුත් මෙහෙයක් නොකො ට
පැටවුණු බරක් මෙන් ලංකා පොළාව පිට
පසුවන ඒක හොඳද ලංකා පුතකු හට

හිස පිට වැටෙන හෙන උසුලන්නට සැදෙව
වට පිට රැවුම් ගෙරවුම් ගැන කන් නොදෙ ව
මරණෙට වුවද සතුටින් යන්නට බැඳෙව
එම විට සැදෙන නිදහස් සුවයෙන් සැදෙව

i. මෙම පද්‍ය පන්තිය ලියා ඇත්තේ කවරක් අරමුණු කරගෙනද?

.............................................................................................................................

ii. කෘදන්ත පද හතරක් සහිත පද්‍ය පාදය කුමක්ද?

.............................................................................................................................

.............................................................................................................................

iii. විධික්‍රියා පද හතරක් සහිත පද්‍ය පාදය කුමක්ද?

.................................................................................................................................................

iv. මෙම පද්‍ය පන්තියේ රචකයා කවුරුන් ද?

.................................................................................................................................................

v. දිවි නොතකා සතුටින් යුධජයග්‍රහනයට ගිය අපේ රණවිරුවන් වෙනුවෙන් යෙදිය හැකි මෙහි ඇතුළත් උචිතම පද්‍ය පාදය කුමක්ද?

.................................................................................................................................................

vi. තමන්ට හැකි පමණින් ආගමට රටට යුතුකම් ඉටු කළ යුතු බව කියවෙන පද්‍ය අර්ධය ලියන්න.

.................................................................................................................................................

vii. පහත පදවල අර්ථය ලියන්න.

අ) සමයට ...............................

ආ) සෙට .............................

ඇ) තිරසර ................................

ලකුණු 30යි.

.